දෙපාර්තමේන්තු නියෝග 02/2017

මගේ අංකය: පා/1/2/5/1
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.03. 29

අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන / පර්යේෂණ),
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී/ අතිරේක අධ්‍යක්ෂවරුන්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

## අනවසර අල්ලා ගැනීම් පිළිබඳව
## මාසික වාර්තාව

කෘෂිකර්ම දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී, දෙපාර්තමේන්තුවෙහි ඉඩම් හා ගොඩනැගිලි අනවසරයෙන් අල්ලා ගැනීම් සිදුවීම බරපතල ගැටළු ඇති කිරීමට හේතුවන බවත්, වහාම කඩිනම් විසඳුම් ක්‍රියාමාර්ග ගත යුතු බවත් සාකච්ඡා කරන ලදි. ඉදිරියේදී මෙවන් ගැටළු උද්ගත වීම වැළැක්වීම සඳහා මෙම දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කරනු ලැබේ.

02. ඔබ අධීක්ෂණය යටතෙහි ඇති, දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සියලු තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම හා අනවසර අල්ලා ගැනීම් වලින් තොරව ආරක්ෂා සහිතව පවත්වා ගැනීම ඔබ වෙත පැවරෙන වගකීමක් වන අතර එවැනි අනවසර අල්ලා ගැනීමක් සිදුවන්නේ නම් වහාම ඒ සම්බන්ධව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතුය.

03. අනවසර අල්ලා ගැනීම් පිළිබඳව මාසික වාර්තාව, ඇමුණුම් අංක 01 ආකෘතිය අනුව සකසා, සෑම මාසයකම ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම අනිවාර්ය වන අතර අනවසර අල්ලා ගැනීම් නොමැත්තේ නම්, මාසිකව හිස් වාර්තාවක් හෝ එවීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුය. අදාළ මාසයේ වාර්තාව එළැඹෙන මාසයේ 10 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවීමට සටහන් කර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

04. ඒ අනුව, 2017 මාර්තු මස දක්වා (මාර්තු මස ද ඇතුලත්ව) අනවසර අල්ලා ගැනීම් පිළිබඳ අදාළ වාර්තාව, 2017 අප්‍රේල් 11 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ පාලන 02 (භෞතික සම්පත් පාලන ශාඛාව) වෙත යොමු කරන ලෙසත් එතැන් සිට අඛණ්ඩව අදාළ මාසයේ වාර්තාව ඊළඟ මාසයේ 10 වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවන ලෙසත් කාරුණිකව දන්වමි.

05. මාසික වාර්තා එවීම පිළිබඳ මනා අධීක්ෂණය හා පසු විපරම පවත්වා ගන්නා ලෙසත්, සියලු අධ්‍යක්ෂ වරුන් යටතේද මේ සම්බන්ධ ලේඛනයක් පවත්වාගන්නා ලෙසත්, ඒ අනුව ඉදිරියේදී කල්පසු වූ අනවසර අල්ලා ගැනීම් වාර්තා වීමට ඉඩක් නොමැති බවත් මෙම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට වග බලා ගන්නා ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එච්.පී. දයාමැණිකේ සරත්චන්ද්‍ර.
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත්:

| | | |
|---|---|---|
| 1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. | } | කාරුණික දැන ගැනීම පිණිස |
| 2. විගණකාධිපති. | } | |
| 3. කෘදෙ/ප/2/4/1/08 ගොනුවට | - | සෑම මසකම 10 වන දිනට මාසික වාර්තා එවීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සඳහා. |